**මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.04.11 දින පැවති මහා සභාවේ වාර්තාවයි.**

2022.04.11වන දින පෙ.ව.9.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

අද දින සභා රැස්වීමට පැමිණ සිටින ඔබ සියලු දෙනාම ඉතා ආදරයෙන් පිළිගන්නා අතර, අද දින සභා රැස්වීම ආගම සිහි කිරීමෙන් අනතුරුව ආරම්භ කරමු. අනතුරුව පසුගිය සභාවේ සභා වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

පසුගිය සභා වාරයේදී මා විසින් ඉදිරිපත් කරනලද යෝජනා වලට අනුව ලිපි යොමුකර තිබෙනවාද? එසේ යොමුකර ඇත්නම් එම ලිපිවල පිටපත් මා වෙත ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

පසුගිය සභා වාරයේදී ගරු මන්ත්‍රී ආනන්දන් මැතිතුමා විසින් ආයුර්වේද රෝහල පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කළ අතර අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් ද එම යෝජනාව පිළබඳ අදහස් ඉදිරිපත් කරන ලදී. ඒ පිළිබඳ තීරණයට අනුව කටයුතු සිදුකර තිබෙනවාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මැයි මස 20 වන දින සාමිමලයේදී ජංගම සේවාවක් සිදු කිරීමට සංවිධානය කර තිබෙනවා. අවශ්‍ය බෙහෙත් ලබාදෙන ලෙස ලිපියක් ද යොමුකර තිබෙනවා.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

පසුගිය සභාවේ වීදි ලාම්පු භාවිතය අවම කිරීම පිළිබඳව ලිපියක් සභාවට පදිරිපත් කරන ලදී. භාවිතය 50% කින් අවම කරන ලෙසට පවසලා තිබෙනවා. නමුත් අළුත් වීදි ලාම්පු සවි කිරීම, මීට පෙර සවි කරන ලද වීදි ලාම්පු අළුත්වැඩියා කිරීම ආදිය පිළිබඳව කිසිදු ලිපියක් මෙතෙක් යොමුකර නැහැ. මැතකදී වීදි ලාම්පු පිළිබඳව කිසිදු වැඩසටහනක් ඉදිරිපත් කර නැහැ. උදාහරණයක් වශයෙන් රදර්ෆුඩ්පාලම අසල සවිකර ඇති වීදි ලාම්පුව පළුදු වී අවුරුද්දක් වෙනවා. මේ දක්වා එය අළුත්වැඩියා කර නැහැ. ලකම් කෝවිල අසල සවිකර ඇති වීදි ලාම්පුවත් එලෙසමයි. මෙය ඉතා කණගාටුදායක සිද්ධියක්. මෑතකදී සවි කිරීමට ගිය වීදි ලාම්පු 2 ම සවි කරන අවස්ථාවේදීම පළුදු වුණා. ඒවාට කුමක් සිදුවූවාද කියා දන්නේ නැහැ. මෙවැනි කරුණු නිසා අපට මහජනතාවට පිළිතුරු දීමට බැරි තත්වයක් උදාවී තිබෙනවා. 20 වෙනි දිනට පෙර මේ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි. පසුගිය අයවැයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී විසින්වෙන් කරන ලද වීදි ලාම්පු සවිකිරීමේ වැඩ සටහනෙන් මා හට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් වීදි ලාම්පු තුනක් පමණයි සවිකළේ. ඒ නිසා 50% කින් අවම කරන ලෙස පවසා ඇති නමුත් සම්පූර්ණයෙන්ම වීදි ලාම්පු සවි නොකරන ලෙස කොහේවත් සඳහන් වෙලා නැහැ. මීට පෙර ලැබුණු ටිකවත් සවිකර අවසන් කළ යුතුයි නේද? ඒ සඳහා කටයුතු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
පසුගිය සභා රැස්වීමේදී ජංගම සේවාව පිළිබඳ යෝජනාවට අනුව ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් අවශ්‍ය ස්ථාන වලට ලිපි යොමු කළාද? එසේ යොමු කළේ නම් එහි පිටපත් අදාල මන්ත්‍රීවරුන් වෙත ලබාදෙන්න. ඒ සමගම ඒ ඒ කොට්ඨාශ යනුවෙන් සදහන් කර තිබුණද, සාමිමලේ ප්‍රදේශයේ කොට්ඨාශ 3 ක් සහ ග්‍රාම නිලධාරී වසම් 4 ක් සම්බන්ධ කරගනිමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් HTO ආයතනයෙන් විශාල ජංගම සේවාවක් සිදුකළා. මෙම කාර්යය සදහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ HTO ආයතනයට මාගේ ස්තූතිය පුදකරමි. එමෙන්ම එම වැඩසටහනෙහි විශාල යහපත් දේ සහ අඩුපාඩු ද තිබුණ බවට ජනතාව පැවසුවා. එනිසා තවත් ජංගම සේවාවක් සාමිමලේ ප්‍රදේශයට ලබාදෙන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ලිපියක් යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**
2022.03.14 දිනැති සභා වාර්තාව නිවරැදි බවට මා යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
බාධා කිරීම සම්බන්ධව සමාවෙන්න. මෙම සභාවේ ගරු සභාපතිතුමිය ඇතුළු පරිපාලනය සහ ලේකම්තුමාට දෙමළ භාෂාවෙන් කතා කළ හැකියි. ඒ අනුව ලිපි යොමු කිරීමේදී සහෝදර සිංහල භාෂාවෙන් තිබුණද ඒ සමගම දෙමළ භාෂාවෙන් කොටසකුත් සම්බන්ධ කර ගත යුතුයි. එකක් මෙය භාෂා පරිවර්ථනය කළ යුතුයි. එසේ නැතිනම් ලිපිය සකස් කරන අවස්ථාවේදීම පහළ කොටසේ දෙමළ භාෂාවෙන්ද සකස් විය යුතුයි. සහෝදර භාෂාවෙන් සකස් කළ ලිපියේ සදහන් කරුණු අපි අවබෝධ කර ගත යුතු නම් තවත් සහෝදර මන්ත්‍රීවරයෙකුගේ උදව් ලබා ගත යුතුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සියල්ල භාෂා දෙකෙන්ම සදහන් වෙනවා. අවශ්‍යනම් සියලුම ලිපි ඉදිරිපත් කරන්නම්. සමහර අවස්ථාවලදී භාෂාව සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කළ ආයතනයක් වෙත අප භාෂාවේ ලිපි 20 කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමට මට සිදු වුණා. ඒ සියලුම ලිපි තිබුණේ සහෝදර භාෂාවෙන්. මෙය අපහසුතාවයට පත් කරන කාර්යයක් බවට සදහන් කරමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ලිපි යොමු කිරීමේදී භාෂා දෙකෙන්ම යොමු කරන්න බැහැ නේද?

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, භාෂා දෙකෙන්ම යොමු කිරීම තුළින් අපගේ භාෂාවටත් පිළිගැනීමක් ලැබෙනවා. පරිපාලනයමය ගැටළු තියෙන්න පුළුවන්. නමුත් රජයේ ආයතනවල පරිපාලනයමය ක්‍රමය තුළ භාෂා දෙකම අනිවාර්ය බව සදහන් වෙනවා. මෙවැනි ලිපි සහෝදර භාෂාවෙන් යොමු කරලා ඒ පිළිබඳව යම් ගැටළුවක් මතු වුවහොත් ප්‍රශ්නයක් වෙනවා. එනිසා ගරු සභාපතිතුමිය මේ පිළිබඳ වූ සම්පූර්ණ වගකීම භාර ගෙන අනාගතයේ දී ලිපියේ අනිත් පිටුවේ හෝ දෙමළ භාෂාවෙන් සකස් කළ යුතුයි. මෙහිදී මතුවන යම් ප්‍රශ්නයක් පිළිබඳව අවබෝධයක් ලබාදිය යුතු බවට අපි සලකමු. එහිදී සහෝදර භාෂාව මගින් එම අවබෝධය, ලබාදීමේදී එය අපහසු

කාර්යයක් වෙනවා. නමුත් දෙමළ භාෂාවෙන් ලිපි යොමු කිරීමේදී අමාත්‍යාංශවල හෝ රජයේ ආයතනවල වෙනම භාෂා පරිවර්තක නිලධාරීන් සිටිනවා. ජනාධිපති ලේකම් කාර්යාලයෙනුත් දෙමළ භාෂාවෙන් ලිපි ලැබිලා තිබෙනවා. එම ලිපි ලේකම්තුමාගේ අවධානය පිණිස මම ඉදිරිපත් කර තිබෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
හොදයි ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි කාලයේදී ඔබතුමා පවසන පරිදි දෙමළ භාෂාවෙනුත් සකස් කිරීමට කටයුතු කරන්නම්.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඔබතුමිය පවසන දෙය මට තේරෙනවා. ඉදිරියේදී එලෙස කටයුතු කරමු. නමුත් මීට පෙර ඉදිරිපත් කළ ලිපි සම්බන්ධව මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරීන් දෙමළ භාෂාවෙන් ලිපි සකස් නොකිරීම පිළබඳව පැවසුවහොත්, මම 20 කට වැඩි ලිපි සංඛ්‍යාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබුණ ලිපිත් ඉදිරිපත් කර තිබෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ලැබෙන ලිපිත් භාෂා දෙකෙන්ම තිබෙනවා. මෙහිදී පරිපාලනමය ගැටළු තිබෙනවා. එනිසා භාෂා දෙකෙන්ම තිබිය යුතුයි. මෙය දේශපාලනමය වශයෙන් බැලුවහොත් මාධ්‍යවලට යන එක එක්තරාප්‍ර වෘත්තියක් පමණයි. මම මෙය උදාහරණයක් වශයෙනුයි කියා සිටින්නේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
2018 වර්ෂයේ මැයි මස දී පමණ අපගේ ප්‍රාදේශීය සභාව මගින් සේවාවන් ලබාගන්නා මහජනතාවට ලිපි යොමු කිරීමේදී දෙමළ භාෂාවෙන් යොමුකළ යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කර තීරණයක් ලබාගෙන තිබුණා. අදත් ත්‍රීරෝද රථ රියදුරෙකුට ලිපියක් අවශ්‍ය නම් අපි ලබා දෙන්නේ සිංහල භාෂාවෙන්. ඒ අය අපෙන් අහනවා මෙවැනි ලිපි දෙමළ භාෂාවෙන් ලබා නොදෙන්නේ ඇයි කියා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ත්‍රීරෝද රථ රියදුරන්ට ලිපි ලබාදීමේදී  දෙමළ භාෂාවෙන් සකස් කළ ලිපි වලට මම අත්සන් කර තිබෙනවනේ. ත්‍රීරෝද රථ ගාලේ  සභාපතිතුමා සහෝදර භාෂාව කතා කරන කෙනෙකු නම් ඔහුට අපි ලිපිය ලබා දෙන්නේ සහෝදර භාෂාවෙන්. ඉදිරි කාලයේදී අපි සලකා බලමු.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සමහර සහෝදර භාෂාවෙන් සකස් කළ ලිපි මම ගොනු  කර තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යවන ලිපි වුවත් සහෝදර භාෂාවෙන් නේද සකස්කර යවන්නේ. එහි සියයකට අධික ද්‍රවිඩ භාෂා නිලධාරීන් සිටිනවා නේද? ඔබතුමියත් අහන්න. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අපිත් ඒ සඳහා බලපෑමක් ලබාදෙන්නම්.

**තීරණ අංක 01**
ඉදිරියේදී සභාව මගින් ඉදිරිපත් කරන ලිපි භාෂා පරිවර්තනය කර භාෂා දෙකෙන්ම යොමු කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

මීළඟට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
**යොමුව** - ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා - මස්කෙළිය ප්‍රාදේශීය සභාව
**විෂය** - 2022.04.11 වන දින සභා රැස්වීම සඳහා පැමිණීමට නොහැකි බව දන්වන නිවාඩු ඉල්ලීම් ලිපිය

**ලිපි අංක 02**
**යොමුව** - ගරු මන්ත්‍රිනී කේ.එල්.ඒ.රංජනි මැතිතුමිය - මස්කෙළිය ප්‍රාදේශීය සභාව
**විෂය** - 2022.04.11 වන දින සභා රැස්වීම සඳහා පැමිණීමට නොහැකි බව දන්වන නිවාඩු ඉල්ලීම් ලිපිය

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු ඉල්ලීම් ලිපි මා විසින් සභාවට යෝජනාකර ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 02**
ගරු මන්ත්‍රීවරුන්ගේ නිඩාඩු සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ලිපි අංක 03**
**යොමුව** - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අඹගමුව කෝරළය
**විෂය**- "ගම සමග පිළිසඳර"වැඩසටහන පිළිබඳ වූ ලිපිය

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
දෙවන අදියර වැඩසටහන යටතේ සමහර යෝජනා සඳහන් කර නැහැ. එනිසා මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉල්ලීම් ලිපියක් සකස්කර යොමු කරන්න.

**ලිපි අංක 04**
**යොමුව** - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
**විෂය**- මස්කෙළිය ප්‍රාදේශීය සභාව වෙත ඉඩම් ලබාදීම පිළිබඳ වූ ලිපිය

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
නෝටන් වීදිය ලියාපදිංචිකර නොමැති බව පසුගිය කාලයේදී මම යෝජනා ඉදිරිපත් කර තිබුණා.ඒ සඳහා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. එයට සභාව වෙත මාගේ ස්තූතිය පුද කර සිටිමි.

**ලිපි අංක 05**
**යොමුව** - සී.ටී.පෙරුමාල්, සාමුණ්ඩෙෂ්වරී ෆාමසි
**විෂය** - පුස්තකාලය සඳහා පුවත්පත් මිළදී ගැනීම පිළිබඳ වූ ලිපිය

**තීරණ අංක 03**
ඉහත සඳහන් ලිපියට අනුව පුස්තකාලය සඳහා පුවත්පත් මිළදී ගැනිමේදී ඒ සඳහා වැඩි වූ මිළ ගණන් වලට අනුව ගෙවීම් සිදු කිරිමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ලිපි අංක 06**
**යොමුව** - පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත
**විෂය** - පුහුණු වැඩසටහන පිළිබඳ වූ ලිපිය

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මුදල් කමිටුවටත් මෙම කාරණාව ඉදිරිපත් කර තිබුණා. පුද්ගලයින් 03 දෙනෙක් ඉල්ලා තිබුණා. එනිසා එක් අයෙක්ව පමණක් යොමු කරන්න. මෙම කාර්යය ක්‍රියාත්මක කළ හැකි අයෙක්ව යොමු කරන්න.

| |
|---|
| **තීරණ අංක 04**<br>ඉහත සදහන් වැඩමුළුව සදහා එක් නිලධාරියෙකු පමණක් යොමු කිරීමට සභාව තීරණය කරන ලදී. |

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාවේ විෂය අංක 07 යටතේ සැණකෙළිය පැවැත්වීම සදහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දී තිබෙනවා. ඒ අනුව සභාවට ලැබෙන ප්‍රතිලාභය කුමක්ද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ක්‍රීඩා පිටිය ලබා ගැනීම සදහා වූ අය කිරීම සහ සැණකෙළිය සදහා වූ බදු සභාවට ගෙවනු ලබනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ටෙන්ඩර් කැදවීමෙන් තොරව සිදුකල හැකිද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
වෙනත් කවුරුන් හෝ ඉල්ලා නැහැ. ක්‍රීඩා පිටිය වෙන් කරගෙන ඒ අය සැණකෙළිය පවත්වනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම කටයුත්තේ දී පසුගිය අවස්ථාවේ මෙන් නොමැතිව සභාවට ගැටළුවක් සිදු නොවන පරිදි අවශ්‍ය කටයුතු කරගන්න. අයකිරීම පිළිබඳව ගැටළු මතු නොවන පරිදි වගබලා ගන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම සැණකෙළිය සදහා අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් මුදල් කමිටුවේ සාකච්ඡා කර තිබෙනවා. ක්‍රීඩා පිටිය ලබාදීම යනු මස්කෙළිය ප්‍රාදේශීය සභාවට යටත් වන බැවින් මුදල් කමිටු නිර්දේශය ලබාදීම මා පිළිගන්නවා. නමුත් දැනට රටතුල පවතින තත්වය සහ වෙනත් කරුණු සැලකිල්ලට ගත යුතුයි කියන එකයි මගේ අදහස. මන්ද ඔවුන් අය කිරීමට යන ප්‍රවේශපත් ගාස්තුව කොපමණද? එය මහජනතාවට දරාගත හැකිද? මහජනතාව අපහසුතාවයට පත්වේද? යන කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතුයි ගරු සභාපතිතුමියනි. පවතින අද වැනි තත්වයක දී සැණකෙළි හෝ උත්සව සදහා ආරාධනා කරන අවස්ථාවේ දී නුවරඑළිය වසන්ත උදානය උදාහරණයට ගන්න. හේතුව නුවරඑළිය වසන්ත උදාන උත්සවය ආරම්භ කරන අවස්ථාවේ එහිදී ප්‍රශ්න මතු වී තිබෙනවා. ආරම්භක උත්සවය අවලංගු කිරීම වැනි තැනට පැමිණෙන්න තරම් එම උද්ඝෝෂණය බලපෑමක් වී තිබෙනවා. මෙවැනි සිදුවීම්

මෙහිදීත් සිදු වෙන්න පුළුවන්. සිදු නොවෙන්නත් පුළුවන්. එය අප ප්‍රදේශයේ තත්වය මතයි රදා පවතින්නේ. වැඩි මුදලක් අය කරන අවස්ථාවේදී මෙම ප්‍රදේශයේ ජනතාව පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ සභාවේ නමටයි. එනිසා දැනට රටතුල පවතින තත්වය දැඩි සැලකිල්ලට ගනිමින් සැණකෙළිය සදහා අනුමැතිය ලබාදීම සම්බන්ධව හොදින් කල්පනා කර තීරණයක් ලබා ගන්න. මුදල් කමිටුවේ නිර්දේශය ලබා දී තිබෙන බැවින් මෙය ක්‍රියාත්මක කිරීම සදහා සභාවේ අනුමැතිය ලබා දුන්නොත් ක්‍රීඩා පිටිය ලබා දී තිබෙන නිසා ප්‍රාදේශීය සභාවයි මෙම සැණකෙළියයි අතර සම්බන්ධයක් නොමැති බවට ප්‍රකාශ කළ නොහැකියි. ඇගිල්ල දිගු කරන්නේ ප්‍රාදේශීය සභාවටයි. එවැනි අවස්ථාවක් මතු වුවහොත් අපි අනුමැතිය පමණයි ලබා දුන්නේ යනුවෙන් කිසි කෙනෙකුට මෙය පැහැදිලි කර කර ඉන්න බැහැ. ඒ අවස්ථාවේ සමාජ මාධ්‍ය වල සහ අනෙකුත් ක්‍රම මගින් ඉදිරිපත් වන දෝෂාරෝපණ, වෙනත් ආකාරයකින් තියෙන්න පුළුවන්. එනිසා අඩු මුදලක් අයකර ගනිමින් සැණකෙළිය පවත්වන්න පුළුවන් නම් එම සැණකෙළිය පවත්වන ලෙසට ඔවුන්හට පවසන්න. ඒ තුලින් විවේචන ඉදිරිපත් වුවහොත් මෙම සැණකෙළිය සදහා ක්‍රීඩා පිටිය ලබාදීම පිළිගත හැකිද? යන්න සභාවේ සියළුම මන්ත්‍රීවරුන් තීරණය කළ යුතුයි. ක්‍රීඩා පිටිය වෙන්කර ගනිමින් මුදල් කමිටුවේ නිර්දේශය මත ක්‍රියාත්මක කිරීම නිසා අපට ප්‍රශනයක් නැහැ. නමුත් ඉන් පසුව මුහුණ දීමට සිදුවන ගැටළු පිළබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කර තීරණයක් ලබා ගන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

රටේ පවතින තත්වය නොතකා මෙම අවස්ථාවේ සැණකෙළියක් පවත්වමින් සභාවට ආදායම ලබා ගන්නවා කියා කවුරුන් හෝ චෝදනා නොකළ යුතුයි. එසේ වුවහොත් අප සියළුම දෙනා අපහසුතාවයට පත් වීමට ඉඩ තිබෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

නමුත් නුවරඑළියේ එහෙම සැණකෙළි පැවැත්වෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

නුවරඑළිය කියන්නේ සංචාරක ප්‍රදේශයක් නේද? එය වෙනම කතාවක්.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු සභාපතිතුමියනි, මෑතකදී අපගේ සභාවේ සිව්වන වර්ෂය පූර්ණය නිමිත්තෙන් වැඩසටහනක් සංවිධානය කර තිබුණා. එයටත් විශාල වශයෙන් විවේචන ආවා. එනිසා මෙම සැණකෙළිය පැවැත්වීම සම්බන්ධව හොදින් සාකච්ඡා කර තීරණයක් ලබා ගන්න. මෙම වැඩසටහන සමුපූර්ණයෙන් නවතා දමන ලෙස අපි ඉල්ලා සිටින්නේ නැහැ. මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී මුහුණ දීමට සිදුවන ගැටළු පිළිබඳව සාකච්ඡාකර තීරණයක් ගන්න. මේ අවස්ථාවේ රටතුල ජනතාව පත්ව සිටින තත්වය අප හොදින් දන්නවා. සැණකෙළියක් පැවැත්වුවහොත් ඒ සදහා අනිවාර්යයෙන් ජනතාව පැමිණෙනවා. නමුත් අපි ජනතාව අමාරුවේ දාන්න හොද නැහැ. එනිසා මෙම කාර්යයේ ප්‍රතිවිපාක පිළිබඳව කල්පනා කරමින් ඉන් අනතුරුව මේ සදහා තීරණයක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ක්‍රීඩා පිටිය වෙන් කර ගත්තහම ඇති, ටෙන්ඩර් ක්‍රමයක් අවශ්‍ය නැහැ කියලා දැන් මොහොතකට පෙර පැවසුවා. මෙම කාර්යයම දීපාවලී කාලයේ දී පෞද්ගලිකව අප සැණකෙළියක් නොපවත්වන අවස්ථාවේදී, ඔහු දින පහකට වෙන්කර ගෙන සැණකෙළියක් පැවැත්වීමට ඉල්ලා සිටිය හොත් සභාවේ අනුමැතිය ලබා දෙනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ඒ සමගම තවත් පුද්ගලයෙකු ඉල්ලා සිටියහොත් ටෙන්ඩර් ක්‍රමයට යන්න සිදු වෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
තවත් පුද්ගලයෙක් නොමැතිව මුදල් කමිටුව වෙත ලිපියක් යොමුකර ක්‍රීඩා පිටිය ඉල්ලා සිටියහොත් ලබා දෙනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
දීපාවලි උත්සවය සදහා පුවත්පත් දැන්වීම් පළ කිරීමෙන් අනතුරුවයි ටෙන්ඩර් ප්‍රසිද්ධ කරන්නේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මම විතර්ක කිරීම සදහා මෙම කාරණාව අහන්නේ නැහැ. ක්‍රීඩා පිටිය වෙන්කර ගත්විට ඒ අයට කුමන පහසුකම්ද සපයා දෙන්නේ?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ජලය සහ විදුලිය පහසුකම් සපයා දෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ක්‍රීඩා පිටිය වෙන්කර ගන්නා අයට ක්‍රීඩා පිටිය ලබා ගන්නා අවස්ථාවේදී අපි කොන්දේසි පනවනවාද? වාචිකව පමණයි නේද කියා සිටින්නේ. එදා ත්‍රීරෝද රථ රියදුරන් සදහා ක්‍රීඩා පිටිය වෙන්කර ගෙන තිබුණා. නොමිලේ ඉල්ලා සිටියා ලබා දුන්නේ නැහැ. පසුව මුදල් ගෙවලා තමයි ලබා ගත්තේ. එදින ඒ අයට ගැටළුවක් මතු වී ඔබතුමිය විදුලිය කපා හැරියා. එය නිවරැදිද? සභාව මගින් ඉදිරිපත් කල ලේඛනයක් හේතුකොටගෙන තමයි එදින ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
එක්තරා ත්‍රීරෝද රථගාලක රියදුරන් තවත් ත්‍රීරෝද රථගාලක රියදුරන්ට ක්‍රීඩා කරන්න දුන්නැහැ. එනිසයි එදින විශාල ගැටළුවක් මතු වී තිබුණේ. ඔබතුමා ඒ අවස්ථාවේදී එතැන සිටියේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
එනිසා මින් ඉදිරියේදී ක්‍රීඩා පිටිය ලබාදෙන අවස්ථාවල නීතිරීති සටහන් කර දැනුම්දීමක් ලබාදෙන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සැණකෙළියක් සදහා ක්‍රීඩා පිටිය වෙන්කරගෙන තිබුණට කමක් නැහැ. කවුරුන්හට වුවත් ක්‍රීඩා පිටිය වෙන්කර ගත හැකියි. මෙහි ප්‍රතිවිපාක පිළබඳවත් කල්පනා කළ යුතුයි. රටේ දැනට පවතින තත්වය පිළබඳවත් අවධානය යොමුකරමින් ක්‍රීඩා පිටිය ලබාදෙන්න තිබුණා. පළමුව ක්‍රීඩා පිටිය ලබාදීමත් වැරැදියි. රටතුල උද්ඝෝෂණ පැවැත්වෙමින් තිබෙනවා. විශාල උද්ඝෝෂකයින් පිරිසක් ක්‍රීඩා පිටිය තුලට පැමිණ යම් අලාභහානියක් සිදුකළහොත් කාගෙන්ද ඒ පිළිබඳව විමසන්නේ? වගකීමෙන් යුතුව පිළතුරුදීම සදහා බැදී සිටිනවා. එකම අවස්ථාවේ දෙදෙනෙක් පැමිණ ඉල්ලා සිටියහොත් මොකද කරන්නේ?

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
පළමුව සැණකෙළියක් වැනි වැඩසටහනක් අවශ්‍යද නැද්ද කියන එක පිළිබඳව බලමු. ටිකට් පිළිබඳ විස්තර සම්පූර්ණයෙන් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
13 වන දින සැණකෙළිය පවත්වනවා නම් අද දිනය 11 යි. නමුත් ඒ සදහා අවශ්‍ය කිසිම සංවිධානයක් සිදු කර නැහැ. එනිසා මෙහි ඒ පිළිබඳව කතා කර කාලය අපතේ යවන්න එපා. ක්‍රීඩා පිටිය වෙන්කරගෙන තිබෙනවානම් ඒ කතාව ඉවරයි. සැණකෙළිය පවත්වන්න සභාව අනුමැතිය ලබා නොදෙන්නේ නම් එම මුදල ආපසු ගෙවනවාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ඔව්, එසේ නම් මුදල ආපසු ලබාදිය යුතුයි නේද?

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මෙහි ආරම්භය වැරැදියි. මහජනතාව සම්බන්ධ කටයුත්තක් බැවින් තීරණයක් ලබා ගැනීමේදී සභාවට ඉදිරිපත් කර තීරණය කළ යුතුයි නේද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
සභාව අවසන් කිරීමෙන් පසුවයි ඔවුන් පැමිණියේ.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
එසේනම් විශේෂ සභාවක් කැදවන්න තිබුණා නේද? සභාවේ තීරණයකත් සමග කටයුතු කර තිබුණා නම් මෙහි ගැටළුවක් මතුවන්නේ නැහැ නේද? වෙනත් කටයුතුතක් නම් කමක් නැහැ. මේ සදහා සභාවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතුයි නේද?

**ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)**
ගරු සභාපතිතුමියනි, ක්‍රීඩා පිටිය සැණකෙළි සංදර්ශනය සදහා දින කිහිපයකට ඉල්ලා ඇති බවට ලේකම්තුමා විසින් මුදල් කමිටුවේදී ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී එම සැණකෙළි සංදර්ශනය කවුරු විසින්ද සිදුකරනු ලබන්නේ කියා විමසුවා. එවිට යටියන්තොට කෙනෙක් බව පැවසුවා. එම පුද්ගලයින් ඒ පිළිබඳව සාකච්ඡාකර ටිකට්පත් මුද්‍රණය කරගැනීම සදහා අද දින පැමිණෙන බවද පැවසුවා. මම මුදල් කමිටුව අවසන්ව එළියට පැමිණෙද්දී මුත්තලී නැමැති අය මා හට කියා සිටියා අපි තමයි එම සැණකෙළි සංදර්ශනය පවත්වන්නේ කියා. ඉන්පසුව එම සැණකෙළි සංදර්ශනය  සම්බන්ධව ලබාගත් තීන්දු තීරණ කෙලෙස ලබාගත්තාද දන්නේ නැහැ. මෙයින් යම් මුදලක් සභාවට ලබාදෙන බව ඔවුන් පැවසූ නිසා ක්‍රීඩා පිටිය වෙන්කරවා ගැනීමටයි මුදල් කමිටුව අනුමැතිය ලබා දුන්නේ. ලබාගත යුතු තීන්දුව ලිඛිතව ලබා දෙනවාද? නැතිනම් මෙහි තිබෙන රාමුවට (Shedule එක) අනුව සිදු කරනවාද? කියා ඉදිරිපත් කළේ නැහැ. එනිසයි දැන් මෙහි ගැටළුවක් වී තිබෙන්නේ. අනෙක් කාරණය, සැණකෙළි සංදර්ශනය  කවුරු විසින් කළත් දැන් ගැටළුවකට ලක් වී තිබෙන්නේ රටතුල පවතින තත්වය සමග ජනතාව අපහසුතාවයකට ලක්වෙන ආකාරයෙන් එහි මිල දර්ශනය ඉහළ අගයක් ගැනීමයි. නමුත් එම ආයතනයද අපහසුතාවයකට ලක්වීමට හැකියාවක් පවතී. එනම්, එතුමන්ලාද දුර සිට බඩු බාහිරාදිය ගෙනවිත් මෙවැනි සිද්ධියක් වුවහොත් එය එම ආයතනයටද බලපාන නිසයි. එනිසා එම කරුණද සැලකිල්ලට ගෙන ජනතාවට යම්කිසි ආකාරයකින් සාධාරණයක් වන ආකාරයට ඒ පිළිබඳව සාකච්ඡා කර හෝ ඒ අය ගෙන්වා හෝ විසදුමකට පැමිණෙන්න.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**
රටතුල පවතින තත්වයද, ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික තත්වයද සැලකිල්ලට ගනිමින් මෙම සැණකෙළිය පැවැත්වීම පිළිබඳව තීරණයක් කළේ නම් සුදුසු බව මාගේ අදහසයි. අවුරුද්දකට

වතාවක් මෙවැනි දෙයක් සිදු කිරීමේදී දරුවන් බොහෝ දෙනෙක් ඇල්මක් දක්වනවා. දැනට පවතින තත්වය මත ඔවුන්ගේ ආශාවන් ඉටු කිරීමේ හැකියාවක් පවුල්වලට නැහැ. සභාවේ ආදායමට බාධා කළ යුතුයි කියන අදහසින් මෙය පවසන්නේ නැහැ. ජනතාවගේ තත්වය පිළිබඳව සහ පසුගිය සතියේ නුවරඑළියේදී සිදු වූ සිදුවීම පිළිබඳව අවධානය යොමුකර මෙය නැවැත්වීම සඳහා උත්සහ කරන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

අපේ යෝජනාව හෝ ප්‍රකාශය පමණයි මෙහිදී ඉදිරිපත් කර තිබෙන්නේ. සභාවට සුදුසු නම් මේ පිළිබඳව තීරණයක් ගන්න. මගේ පෞද්ගලික මතය සභාපතිතුමියට ප්‍රකාශ කර සිටියේ. ඒ අනුව ඔබතුමිය තීරණයක් ගන්න. දැනට රටතුල පවතින වාරතාවරණයත් සමගයි ඔබතුමියට තීරණයක් ලබාගන්නා ලෙස ඉල්ලා සිටින්නේ. අවසානයේ මුදල් කමිටුව හෝ අපි හෝ මැදිහත් වී මෙයට පිළිතුරු සැපයීමට ඉදිරිපත් වන්නේ නැහැ. අවශ්‍ය නම් දේශපාලන මට්ටමින් වෙනත් ආකාරයකට ද මෙය ගෙන යා හැකියි. ඒ අවස්ථාවේදී දොස් පවරා හෝ වෙනත් මොනයම් දෙයක් හෝ පවසමින් මෙය සිදු කරන්න පුළුවන්. එහෙමනෙ වෙන්නේ. එනිසා ඔබතුමිය හා කාර්ය මණ්ඩලය හොඳ සුදුසු විසඳුමක් ලබා ගන්නා ලෙසයි අපි ඉල්ලා සිටින්නේ. අපගේ යෝජනා හා ප්‍රකාශ අපි ඉදිරිපත් කළා. සුබ්‍රමනියම් මන්ත්‍රීතුමත් අදහස් ඉදිරිපත් කළා එය නවත්වන ලෙසට. මම ද මෙම පවතින වාතාවරණය අනුව කරුණු ඉදිරිපත් කරමින් මෙය නවත්වන ලෙසටයි ඉල්ලා සිටින්නේ. ඒ අනුව ඔබතුමිය මුදල් කමිටු සාමාජික මන්ත්‍රීවරුන් සියළු දෙනා සමග සාකච්ඡාකර ඒ පිළිබඳව තීරණයක් ලබා ගන්නේ නම් එහිද අපට ගැටළුවක් නැහැ. නමුත්, සභාව හැටියට මගේ ප්‍රකාශය මෙයයි කියා පැහැදිලිව පැවසිය යුතුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙම සෙල්ලම කුමක් හෝ විහිළුවක් බවට පත්වන්නේ නම් මාද මෙයට මැදිහත් වී මෙය නතර කිරීම සඳහා පාරට බහින්න සූදානම්. දැනට රටතුල පවතින තත්වය අනුව මෙය සෙල්ලම් වැඩක් නෙවෙයි. අනිවාර්යයෙන් පාරට බහින්න සිදු වෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා (එ.ජා.නි.පෙ)</u>**

ගරු සභාපතිතුමියනි, අනෙකුත් ගරු මන්ත්‍රී වරුන්ගේ අදහස් වලට අනුව මෙම සැණකෙළිය මෙම අවස්ථාවේදී පැවැත්විය යුතුද යන ප්‍රශ්නයක් මතුව ඇති අවස්ථාවක, මස්කෙළිය නගරයේ ජනතාවගේ ආදායම් තත්වය සැලකිල්ලට ගනිමින් මෙම සැණකෙළිය නැවැත්වීම සඳහා ඔවුන්හට උපදෙස් ලබාදිය හැකියි. කුමන හෝ ක්‍රමයකින් ජනතාව එතැනට පැමිණෙනවා. නමුත් මෙය ජනතාවට විශාල පාඩුවක් ඇති කරයි. විවිධ චෝදනා ඒවි. ඒ සියල්ල සඳහා පිළිතුරු ලබාදිය යුත්තේ මෙම සභාවෙනුයි. එනිසා මේ පිළබඳව කල්පනාකාරීව කටයුතු කරමු.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**

පසුගිය මුදල් කමිටුව සඳහා මම පැමිණියේ නැහැ. දැනට රටතුල පවතින වාතාවරණයත් සුදුසු නැහැ. ජනතාව සැණකෙළිය නරඹන්න ඉදිරිපත් වෙයි. විවිධ චෝදනාද ඒවි. දැනට රටතුල පවතින වාතාවරණයද සැලකිල්ලට ගනිමින් මෙම කටයුත්ත නවතා දැමීම සඳහා මාගේ අදහස් ඉදිරිපත් කරමි. එමෙන්ම වෙනත් අවස්ථාවලදීද ක්‍රීඩා පිටිය උපයෝගී කර ගනිමින් විවිධ වැඩසටහන් පවත්වන අවස්ථාවලදී මෙන් ඊට සුදුසු පරිදි තීරණ ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමි. දැනටමත් සියළු දේ සිදුවන්නේ කොන්ත්‍රාත් පදනම මතයි. දීපාවලී අවස්ථාවේ රටතුල තත්වය යහපත් අතට හැරුණොත් මම කෙනෙක්ව ඉදිරිපත් කරන්නම්. ඔබතුමියද කෙනෙක්ව ඉදිරිපත්

කරන්න. මෙම කරුණද සැලකිල්ලට ගනිමින් ඒ අවස්ථාවේදී මෙවැනි තීරණයක් ලබා ගැනීමට සිදු වේවි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
එකී පුද්ගලයින් සමග සාකච්ඡාකර මෙය නවත්වා දැමිය හැකියි. නමුත් රටතුල තත්වය යහපත් අතට හැරෙන තෙක් කිසිම කටයුත්තක් සඳහා ක්‍රීඩා පිටිය ලබා දෙන්න බැහැ.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම අවස්ථාවේදී ගරු සභාපතිතුමියට සහ අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් වෙත මාගේ ස්තූතිය පුද කරමි. අද දින රටතුල පවතින තත්වය අනුව තීරණයක් ලබා ගන්නා ලෙස අපි ඉල්ලා සිටියා. ඔබතුමිය මේ සඳහා කැමැති වුවත් මුදල් ආපසු ගෙවීමේදී ගැටළුවක් මතුවුවහොත්?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමනි යම්කිසි කටයුත්තකින් සභාවට ආදායමක් ලැබෙනවානම් මම එය ඉටු කරනවා. එය අනවශ්‍යනම් එම මුදල නැවත ගෙවන එකෙන් මට කිසි ගැටළුවක් නැහැ. ඊයේ දිනයේදීත් නුවරඑළියේ සැණකෙළි පවත්වනවා මම දැක්කා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, පළමුව අප ඉදිරිපත් කරන කරුණු පිළිබඳව ඔබතුමිය පැහැදිලි කර ගන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මට නොතේරෙණවා කියා සිතුවාද? මම තේරුම් කරගෙනයි කතා කරන්නේ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ටිකට් එකේ සභාවේ නිල මුද්‍රාවයි තබන්නේ. එනිසා ගැටළුවක් මතු නොවන පරිදි මෙය සිදු කරන ලෙසයි මම කියා සිටින්නේ. කරන්න එපා කියා සිටියේ නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
යම්කිසි ගැටළුවක් මතු වුවහොත් ඔබතුමාම පාරට බහින බව දැන් මොහොතකට පෙර ඔබතුමා පැවසුවා. ගරු මන්ත්‍රීතුමනි එලෙස පවසනවිට කුමක්ද කරන්නේ?

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
යම්කිසි අලාභහානියක් සිදුවුවහොත් පමණයි මම පාරට බහින බව පැවසුවේ. එය තේරුම් ගන්න.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
සැණකෙළිය සම්බන්ධ අදහස් සමග ජනතාවගේ යහපත උදෙසා තමයි අපගේ ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කළේ. නමුත් මහජනතාවගේ යහපත සම්බන්ධ කර බැලුවහොත් මස්කෙළිය නගරයේ, අනෙක් සියලු ස්ථාන වලට වඩා වැඩි මිළට භාණ්ඩ විකුණනවා. මේ පිළිබඳවත් ටිකක් සොයා බලන්න. තවද මස්කෙළියේ සියලුම ස්ථානවල ගෑස් නැති බවට පවසනවා. නමුත් සියලුම වෙළඳසැල්වල ගෑස් තිබෙනවා. ගරු සභාපතිතුමිය ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන් එකට එකතුවුවහොත් මේ සඳහා විසදුමක් ලබාගත හැකි වේවි. ජනතාවට අවශ්‍ය ගෑස් ලබාදිය හැකියි. ජනතාවගේ යහපත උදෙසා මෙම කාරණාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි. වෙනත් ස්ථානවල හාල් මිල ද විමසූ අතර එම ස්ථාන වලට

වඩා අධික මිළකට මස්කෙළිය ප්‍රදේශයේ හාල් විකුණන බව දක්නට ලැබුණා. මේ පිළිබද මෙතෙක් මෙම සභාවෙන් හඩක් නැගුවේ නැහැ. ජනතාවගේ යහපත උදෙසා අපි සැණකෙළි අවශ්‍ය නැහැ කියා පවසනවා. මේ සම්බන්ධයෙන් ටිකක් අවධානය යොමු කරන්න. ගෑස් පුරවන ලද ගෑස් සිලින්ඩරය ගෑස් නැති හිස් සිලින්ඩරය වගේ ප්‍රදර්ශනය කර තබනවා. නල්ලතන්නියේ සිටින අයට මෙහි සිට රුපියල් 5000.00 ට ගෑස් විකුණනවා. මෙම ප්‍රදේශයේ ජනතාව රුපියල් 3000.00 ක් ගෙවා ලබා ගන්න සූදානමින් සිටියත් ලබා ගන්න ගෑස් නැහැ. වෙළඳසැල්වල භූමිතෙල් විකුණනවා. මෑතකදි දවසක් පාන්දර ගෑස් සිලින්ඩර් බෑවා. එම බාන ලද ගෑස් සිලින්ඩර් ටික ඒ අවස්ථාවේදීම පටවනු ලැබුවා. මම එම ස්ථානයට ගොස් ප්‍රශ්න කළා. එම ගෑස් සිලින්ඩර් ටික ජනතාවට බෙදාදීමට මම මූලික වෙලා කටයුතු කළා. එම අවස්ථාවේදී මම 119 ට දුරකථනයෙන් ඇමතුවා. පොලිසි ස්ථානයේ ස්ථාන භාර නිලධාරී එස්ටීඑෆ් යන අයට දුරකථනයෙන් ඇමතුවා. එවිට වෙලාව 5.45 ත් 6.00 ත් අතර ඇති. ඒ අය එම ස්ථානයට පැමිණියේ 7.00 පමණ. ඉන්ධන වලටත් මෙලෙසමයි. 4, 5 ස් දෙනෙක් බස් එකට පුරවා ගන්නා ලද ඉන්ධන ටික නැවත කෑන් වලට පුරවමින් සිටිනවා. මේ නිසා තමයි ගැටළු අර්බුද නිර්මාණය වෙන්නේ. මෙවැනි අනවශ්‍ය සේවාවන් සදහා අප සභාවෙන් බලපෑම් කළ යුතුයි යන එක මගේ මතයයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

කේ.ජී.කේ.පෙරේරා මන්ත්‍රීතුමිය පසුගිය සභා වාරයේදී කියා සිටියේ ඉන්ධන පිරවුම්හල පැය 24 පුරාම විවෘතව තැබිය යුතු බවයි. ඉන්ධන පිරවුම්හලේ කළමණාකාරතුමා මා සමග ආරාවුලට පැමිණියා මේ කාරණාව කොහොමද සභාවේ කතා කරන්නේ කියා. සමුපකාර ලේකම්තුමා සභාව ගණන් නොගන්නා බව පවසා සිටියා. ඔබතුමන්ලගේ සභාවෙන් කොහොමද ඉන්ධන පිරවුම්හල පැය 24 ක් විවෘතව තැබිය යුතු බවට මෙහෙම තීරණයක් ගන්නේ කියා මෙම යෝජනාව කළ ඔබතුමියට පරුෂ වචනයෙන් බැණ වැදුණා. මෙම කාරණාව සභාවේ කතා කරන විට අපි විරුද්ධ වෙන්න පුළුවන්. අපි විවිධ පක්ෂවල වෙන්නත් පුළුවන්. නමුත් එක් මන්ත්‍රීවරයෙකුට අත දිගු කරනවානම් අපි සියලු දෙනාම එකට එකතුවිය යුතුයි. මම ආනන්දගේ ලොරියේ ගමන් කරන අවස්ථාවක සෙනඟ පිරී ගැවසෙන ස්ථානයක සිට මොකද අපිට පැය 24 ක් ඉන්ධන පිරවුම්හල විවෘතව තබන්න කියන්නේ, ඇයි සභාව ලොකුද? යනුවෙන් කෑ ගසා මගෙන් ඇසුවා. එනිසා මෙවැනි දේකට අපි සූදානම් වෙනවානම් මේ වගේ දේවලුත් බලාපොරොත්තුවෙනුයි අපි යා යුත්තේ. එදා ආනන්දන් මන්ත්‍රීතුමා පැවසුවා ගෑස් සිලින්ඩර් සැපයීම සදහා දින 3 කට පෙර මුදල් රැගෙන ලැයිස්තුවක් සාදාගෙන එම ලැයිස්තුවේ අයට පමණක් ගෑස් සැපයූ බව. එනිසා තමයි ප්‍රශ්න මතුවුණේ. සභාව කවුද අපි ගැන මෙහෙම තීරණයක් ගන්න කියා ඔවුන් පැවසුවා. මේ අයුරින් කතාකර ඔවුන් හැසිරෙන විට මටත් තරහ ආවානම් ආරාවුල වෙනත් ආකාරයකට යන්න තිබුණා. නමුත් එය වැරැදි වැඩක්. එනිසා ඉහත කාරණය ක්‍රියාත්මක කරනවානම් මේ හැම දේටම සූදානමින් ක්‍රියාත්මක විය යුතුයි.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

මේ අයුරින්ම කොරෝනා කාලයේදීත් එක්තරා දෙයක් සිදුවුණා. විවිධ සේවා සමුපකාර සමිතිය මගින් සිදු කරන කටයුතු සම්බන්ධව සභාවට සොයා බැලිය නොහැකි බවට ඔවුන් සිතනවා. අපි කොහොමද මේවා පාලනය කරන්නේ. මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සාකච්ඡා කරන ලද කරුණු වලට පිළිගැනීමක් තිබෙනවානම් ඉන්ධන පිරවුම්හලේ කළමණාකරු , ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමාට විරුද්ධව කතා කරන්න විදිහක් නැහැ. එදත් මම තමයි ගරු මන්ත්‍රීතුමාට නිශ්ශබ්දව යමු කියා පැවසුවේ. සභාව තුල සාකච්ඡා කරන ලද සියලුම දේවල් එම අවස්ථාවේදීම පිටතට යනවා. සභාවට ගරුත්වයක් තිබෙනවා. ඒ අනුව සභාව පවත්වාගෙන යා යුතුයි. මෑතකදී සඟවා තබන ලද ගෑස් සිලින්ඩර් 35 ක් පොලිසිය මගින් ලබාගැනීමට ගරු මන්ත්‍රී

රාජ්කුමාර් මැතිතුමා කටයුතු කර තිබෙනවා. ටික කාලයකට ගෑස් සිලින්ඩර් ලබා නොගතහොත් මේ සදහා විසදුමක් ලැබේවි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

භාණ්ඩ වල සදහන් පරණ මිල ඉවත් කර ඒ සදහා නව මිලක් සදහන් කර විකුණනු ලබනවා.

**<u>ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**

ගරු සභාපතිතුමියනි, මෙතුමා පැවසූ පරිදි මම එදා ඉන්ධන පිරවුම්හල පිළිබඳ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළේ බොහෝ දෙනෙක් මා හට පැවසුවා ශ්‍රී පාද වන්දනාවට පැමිණෙන ජනතාව වෙනුවෙන් මෙම ඉන්ධන පිරවුම්හල දිවාරාත්‍රී සේවය සපයන ආයතනයක් වශයෙන් විවෘතව තැබීම සදහා මෙම කරුණ යෝජනාවක් ලෙස සභාවට ඉදිරිපත් කර සාකච්ඡා කරන්න කියා. සමුපකාරය කියන්නෙත් අපි වගේම ජනතාවට සේවය සපයන ආයතනයක්. එතුමන්ලට මෙහෙම කතා කරන්න බැහැ ගරු සභාපතිතුමියනි. එතුමන්ලත් කරන්නේ මහජනතාවට සේවයක්. එනිසා එතුමන්ලට ඒ ආකාරයෙන් අපිට එහෙම පරුෂ වචනයෙන් බැන වදින්න බැහැ. මම මේ පිළබඳව දැනුයි දන්නේ. සුරේෂ් මන්ත්‍රීතුමා පැවසු පරිදි ඉන්ධන පිරවුම්හලින් සිදු කරන්නේ බැරල් වලට වැඩිපුර ඉන්ධන ලබාදීමයි. පසුව ඒ අය ඒවා ගෙවල්වල තබා ගන්නවා. එම ඉන්ධන අවසන් වූ පසු ඒ අය පැමිණ නැවතත් ඉන්ධන රැගෙන යනවා. මේ අයුරින් සිදුවන නිසා තමයි මෙම ඉන්ධනහලේ මෙලෙස ඉන්ධන හිඟයක් ඇතිවන්නේ කියා බොහෝ දෙනා පවසනවා. මෙය රට පුරා ප්‍රසිද්ධ වූ ප්‍රශ්නයක්. එය කිසි කෙනෙකුට නැහැ කියන්න බැහැ. මට බැන්නට කමක් නැහැ. අපට මීට වඩා දේ කියා මිනිස්සු බනිනවා. නමුත් සමූපකාර නිලධාරී මහතුන් මතක තබාගත යුතුයි ඔනුනුත් අපි මෙන්න මහජන සේවකයන් බව. ඔවුන්ද කරන්නේ සේවයක්. එනිසා මෙම කතාව මට මේ අවස්ථාවේදී කරන්න සිදුවුණේ. මස්කෙළියේ ජනතාව කතා කරන ආකාරය අද පමණක් නොව එදා සිටම අප දන්නවා. සභාවේදී වුවත් බොහෝ දේ කතා නොකර සිටින්නේ මේ නිසයි ගරු සභාපතිතුමියනි.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**

ගරු මන්ත්‍රීතුමිය එදින පැවසුවේ ඉන්ධන පිරවුම්හලින් දිවාරාත්‍රී සේවයක් ලබාදෙන්න කියායි. අපිත් උදේ පාන්දර ගමන් කරද්දී ශ්‍රී පාද වන්දනාව සදහා පැමිණි පිරිස් ඉන්ධන නොමැතිව බස්රථ ගෙනවිත් ඉන්ධන පිරවුම්හල අසල නවතාගෙන සිටින අයුරු දකිනවා. දිවාරාත්‍රී සේවයක් ලබාදුන්නා නම් එම පිරිසට ඉන්ධන පිරවුම්හලින් සේවයක් ලැබෙනවා. එතුමිය එම යෝජනාව සභාවට ඉදිරිපත් කර මහජනතාවට එම වරප්‍රසාදය ලබාදීමටයි කටයුතු කළේ. එතුමියට පරුෂ වචනයෙන් කතා කරනවා නම් ඒ පිළිබඳව විනය කටයුතු කිරීම සදහා සභාපතිතුමිය කටයුතු කළ යුතුයි. මහජනතාව සදහා යම්කිසි අකටයුත්තක් සිදුවන අවස්ථාවක ඒ සදහා කතා කිරීමට සභාවේ මන්ත්‍රීවරයෙක්ට අයිතියක් තිබෙනවා. එදින අප සමගම පෝලිමේ සිට ඉන්ධන ලබාගත් බස්රථ හිමියන් නැවත පසු දිනද පෝලිමේ සිට බැරල් වලට ඉන්ධන ලබා ගන්නවා. ලැබෙන කෙනාට ලැබෙනවා. නැති කෙනාට ලැබෙන් නැහැ. එවිට එම පුද්ගලයින් ආර්ථිකයෙන් වැටෙනවා. එක් දිනක් ඉන්ධන පිරවුම්හලට පාන්දර 2.00 ට ලොරිරථයක් ගෙනවිත් ඉන්ධන ලබාගන්නා අවස්ථාවක ඉන්ධන ලබා ගැනීම සදහා බස්රථයක්තුල පෝලිමේ සිටි රියදුරු මහතෙක් එම ස්ථානයේ කුමක්ද සිදුවන්නේ කියා විමසා එය රූපගත කරන විට එම බස්රථ රියදුරාටද පැමිණ ඉන්ධන ලබාගන්නා ලෙස පවසා තිබෙනවා. බස්රථයට ඉන්ධන ලබාදීමෙන් පසුව කෑන් එකකටද ලීටර් 20 ක් ඉන්ධන ලබාදී තිබෙනවා. එම ස්ථානයේ සිදුවන්නේ වංචාවක්. රථවල නොසිට නිවෙස්කරා ගිය ජනතාව

ඉන්ධන ලබාගැනීම සඳහා පෝලිම්වල සිටිය යුතුයි. මෙහි ව්‍යාපාරයක් තමයි සිදුවන්නේ. එනිසා සභාවෙන් මෙවැනි දේවල්වලට කටයුතු කළ යුතුයි. නැතිව මන්ත්‍රීවරයෙක් වශයෙන් කතාකළා කියා එම පුද්ගලයාට පරුෂ වචනයෙන් බැන තර්ජනය කළ නොහැකියි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මස්කෙළිය ගතහොත් අප දේශපාලඥයින් වශයෙන් 16 දෙනෙක් සිටිනවා. අපි ජනතාව වෙනුවෙන් ඉටුකළේ කුමක්ද කියා ගැටළුවක් මතුවිය හැකියි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
දින දෙකකට පෙර මාහටද පෝලිමේ සිටිය යුතු අවස්ථාවක් මතු වී තිබුණා. මොහොතකට පෙර පොලිසියෙන් මැදිහත් වීමෙන් විස්තර සහිතව ඉන්ධන ලබා දෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඉන්ධන පිරවුම්හල වෙත ලැබෙන ඉන්ධන ප්‍රමාණය සියලු දෙනා වෙත සමසේ බෙදා හැරීම සඳහා සභාවෙන් උපදේශනයක් ලබා දෙන්න.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
රාත්‍රී 12 න් පසුව වැඩි වාහන සංඛ්‍යාවකට ඉන්ධන ලබාදෙනු ලබනවා. ඉන්ධන පිරවුම් හලේ සේවය කරන සේවකයින් පවා අමතර ආදායමක් බලාපොරොත්තුවෙන් වැඩ කරනවා. අපි ජනතාව වෙනුවෙන් යම්කිසි තීරණයක් ලබාදිය යුතුයි.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**
ඉන්ධන ලබාගැනීම සඳහා පසුගිය දින 03 ක් මම පෝලිමේ සිටියා. දිනක් රාත්‍රී වෙලාවක වෙනත් වාහන සඳහා අවිධිමත් ලෙස ඉන්ධන ලබාදීමට නොහැකි වන පරිදි අපගේ වාහනය ගාල්කර තිබුණා. අපගේ ජනතාවගෙන් අධික ලෙස පළි ගන්නවා. ඒ සමගම ඉන්ධන පිරවුම්හලේ දී ජනතාවට භූමිතෙල් ලබාදීම සඳහාද මම උදවු කර තිබෙනවා. ආසන්න වශයෙන් දින 06 ක් මම එතැන රැඳී සිටි නිසා එතැන සිදුවන දේවල් පිළිබඳව මම හොඳින් දන්නවා. පොහොසත් අයට පමණක් සහන ලබාදෙනවා. ඉන්ධන පිරවුම්හල වෙනත් පරිපාලනයක් අතට පත් වුවත්, එය පවිත්‍ර කිරීම, ආරක්ෂා කිරීම වැනි දේවල් සිදු කරන්නේ අපිමයි. එනිසා මේ සඳහා නීතිමය පියවර ගත යුතුයි.

**තීරණ අංක 05**
දැනට රටතුල පවතින තත්වය සැලකිල්ලට ගෙන සැණකෙළි සංදර්ශනය අත්හිටු වීමට තීරණය කරන ලදී.

**<u>සටහන -</u>**
සැණකෙළි සංදර්ශනය පැවැත්වීම සඳහා සංදර්ශන කරුවන් විසින් මුදල් ගෙවා ක්‍රීඩා පිටිය වෙන්කරගෙන සිටීම හා ඔවුන් ඒ සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය ගෙනවිත් තිබූ නිසා මන්ත්‍රීවරුන් සමග දුරකථනයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව සැණකෙළි සංදර්ශනය පැවැත්වීම සඳහා අවසර ලබාදෙන ලදී.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියගේ නිල රථයේ රියදුරු එන්.ශ්‍රී පවිත්‍රන් යන අයට මාසික වැටුප වශයෙන් රුපියල් 36000.00 ක් ලබාදුන් බවට වැය වාර්තාවේ සඳහන් වෙනවා. ආරම්භයේදී ඔහු ඔබ තුමියගේ සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් සිටියා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔව්, දැනට ප්‍රවීණා යන අයව සම්බන්ධීකරණ ලේකම් වශයෙන් වෙනස් කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාවේ වෙනත් රියදුරන් නැද්ද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
නැහැ. ඒ සමගම මගේ ආරක්ෂාව තහවුරු වන පරිදි තමයි රියදුරෙක් පත්කරන්න පුළුවන්. මෑතකදී දිනයක කොළඹ ගොස් පැමිණෙන අවස්ථාවක දී අතරමග ගැටළුවකට මුහුණ දී නිවසට පැමිණෙන විට අළුයම 2.30 පමණ වුවා. මෙවැනි අවස්ථා වලදී විශ්වාස වන්ත අයෙක් සමගයි යන්න පුළුවන්. මීට කළින් සිටිය රියදුරු දිනපතා වැඩට එන්නේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අතිරේක රියදුරන් සභාවේ නොමැති බව ඔබතුමිය පැවසුවා. අතිගරු ජනාධිපතිතුමාගේ ලක්ෂයක රැකීරක්ෂා වැඩසටහන යටතේ පත් වූ රියදුරන් තිදෙනෙක් සිටිනවා නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔව්, මන් කෙනෙක්ව මෑතකදී රැස්වීමකට එක්ක ගියා. ඔහුට හරියට වාහනය ධාවනය කරන්න බැහැ. පසුව ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමා තමයි වාහනය ධාවනය කළේ. මෙවැනි අය විශ්වාස කරගෙන කොහොමද මම දුර ඈත ගමන් යන්නේ? මගේ ආරක්ෂාව ගැනත් මා බලා ගත යුතුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාවේ පවතින මූල්‍ය තත්වය සැලකිල්ලට ගෙනයි මම මෙම කරුණු ඉදිරිපත් කළේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් රියදුරෙකු යොමු කරන විට රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් ද යොමු කරන්නේ? ඒ අය පිළිබඳව විශ්වාස නැද්ද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
නැහැ, සභාව සදහා සුදුසු අයෙක්ව තමයි රියදුරු වශයෙන් තබාගත හැක්කේ. මගේ ආරක්ෂාවත් තහවුරු කරගත යුතුයි නේද? සභාපති පැමිණෙන බවක්වත් නොදැන පාරේ කතා කර කර සිටින අයව, ගරුත්වයක් නොදන්නා අයව, කොහොමද මම රියදුරු වශයෙන් තබා ගන්නේ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
එය පරිපාලනයේ වරදක්. රැකියාවට පැමිණෙන අය පරිපාලනය කරන්නේ කෙලෙසද කියා ඔබතුමිය කටයුතු කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
සෑම වෙලාවකම මට ඔවුන්ගේ පස්සෙන් දුවන්න බැහැනේ. මම යොමු කළ යුතු ස්ථානයට ලිපි යොමුකර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඔබතුමියගේ සම්බන්ධීකරණ ලේකම් වෙනුවට අළුත් කෙනෙක් මාරු කර තිබෙනවා. එය අපට ප්‍රශ්නයකත් නැහැ. ඔබතුමියගේ නිල රියදුරෙක් වශයෙන් බාහිර රියදුරෙක් ඇතුලත් කරගැනීම සදහා ප්‍රතිපාදන තිබෙනවාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
තිබෙනවා. ඒ අයුරින් තෝරා පත් කරගන්නා රියදුරු මාව ආරක්ෂා කළ යුතු කෙනෙක් විය යුතුයි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
වාහනයට රියදුරු වශයෙන් බාහිර පුද්ගලයෙකු බඳවා ගත්විට දීමනා ගෙවීම සභාපති ගේ රාජකාරිය තුලට ඇතුලත්ව තිබෙනවද? එසේ නැති නම් මෙම පරිපාලන ක්‍රමවේදය තුල තිබෙනවාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ඔව්. තාවකාලික සේවකයෙකු පමණයි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
අපගේ ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලයේ ක්‍රියාකාරීත්වය ඉතාමත් උසස් මට්ටමින් තිබෙනවා. තරඟ වලට පවා ඉදිරිපත් වී තෑගි ලබාගෙන තිබෙනවා. ඒ සඳහා මාගේ සුභාශිංශනය ප්‍රකාශ කර සිටිමි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
මුදල් කමිටු වාර්තාව නිවරැදි බවට මා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

## 2022.4.06 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**කාරණා අංක 01**
කාර්යාල ලිපි ද්‍රව්‍ය වල මිළ ගණන් වැඩිවීම හා ඒවා මිළදී ගැනිම සම්බන්ධව මුදල් කමිටුව වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 06**<br>කාර්යාල ලිපි ද්‍රව්‍ය වල මිල ගණන් වැඩිවීම හා එහි අවශ්‍යතාවය පිළිබඳ සලකා බලා එම ද්‍රව්‍ය Shopping System ක්‍රමයට මිළදී ගැනිමට තීරණය කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී. |

**කාරණා අංක 02**
කාර්යාලයේ භාවිතය සඳහා ටෝනර් මිළදී ගැනීමට මුදල් කමිටුව වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 07**<br>ටෝනර් මිළදී ගැනිම සඳහා මුදල් කමිටු නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී. |

**කාරණා අංක 03**
RF – 7744 ට්‍රැක්ටර් රථය සේවිස් කිරීම හා ටයර් මාරු කිරීම සඳහා කරුණු මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 08**
එම කරුණ තාක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කර තාක්ෂණ කමිටුව මගින් ලබාදෙන නිර්දේශයෙන් පසු, RF – 7744 දරණ ට්‍රැක්ටර් රථය සේවිස් කිරීම හා ටයර් මාරු කිරීමට මුදල් කමිටුව තීරණය කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**
විදුලිය නොමැති වෙලාවන් වල කාර්යාලයේ භාවිතය සඳහා ජෙනරේටරය භාවිතය කිරීම සඳහා මුදල් කමිටුව වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 09**
ඒ සඳහා අවශ්‍ය භාණ්ඩවල ඇස්තමේන්තුවක් ලබා ගැනීම හා එම ඇස්තමේතුව අනුව ජෙනරේටරය සකස්කර එය භාවිතයට ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 05**
කාර්ය සාධන තරගය - 2022 නැමැති ලිපිය මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 10**
උක්ත කරුණ සම්බන්ධයෙන් ඇස්තමේන්තුවලට අනුකූලව මෙම වැඩ කටයුතු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සමග අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කරමි.

ස්තූතියි.
ආයුබෝවන්.

| | |
|---|---|
| සභාපති,<br>මස්කෙළිය ප්‍රාදේශීය සභාව,<br>මස්කෙළිය. | ලේකම්,<br>මස්කෙළිය ප්‍රාදේශීය සභාව,<br>මස්කෙළිය. |